ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2514/45 - 2026 නොවැම්බර් මස 13 වැනි සිකුරාදා - 2026.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

(262 වන අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(ආ) වගන්තිය යටතේ
කුරුවිට ප්‍රාදේශීය සභාවේ
සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කුරුවිට ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කුරුවිට ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ කුඩා කුමාරගේ දුමින්ද කසුන් අමරසිංහ මහතා අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් අංක 1 නම් ස්වාධීන කණ්ඩායම් නායකට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නා වූ ද, එම කුරුවිට ප්‍රාදේශීය සභාව සඳහා තෝරා එවිය යුතු සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී ස්වාධීන කණ්ඩායම් නායක විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කතුන්ගල්ලේ මනන්නලාගේ නිහාල් වීරසිංහ මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කුරුවිට ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි කස්තුරිසිංහ හේරත් මුදියාන්සේලාගේ සජිත් ප්‍රියංකර කස්තුරිසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය) 66අ(1)(ආ) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් කතුන්ගල්ලේ මනන්නලාගේ නිහාල් වීරසිංහ මහතා, කුරුවිට ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

කේ. එච්. එම්. සජිත් පී. කස්තුරිසිංහ,
තේරීම්භාර නිලධාරි,
කුරුවිට ප්‍රාදේශීය සභාව.

2026 නොවැම්බර් මස 13 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
රත්නපුර.

EOG 11 - 0096

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*